ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,

ජනාධිපති කාර්යාලය,

කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

**ලංකා සතොස ආයතනය තුළ සිදුවන වංචා දූෂණ සහ අක්‍රමිකතා සම්බන්ධවයි.**

ඔබතුමන් ශ්‍රී ලාංකීය දේශය රාජ්‍යය ආයතනයක් අප ලංකා සතොස ගොඩනැවීමට සහ සතොස නාමය රටේ ජනතාවට දැනෙන නාමයක් ලෙස ගොඩනැංවීමට කරනු ලබන දායකත්වය හා කැපවීම ලංකා සතොස සේවක එකමුතුව ලෙස එහි සියළුම සේවකයන් වෙනුවෙන් මූලිකවම හදවතින්ම ස්තුති වන්නෙමු.

ඔබතුමන්ගේ එම දැක්ම, ඉදිරි ගමන, දිරි ගැන්වීම අනුව අප වැඩකරන සියළුම සේවකයන් සියළු කැපකිරීම් හා දුක් ගැහැට දරා ගනිමින් ආයතනය වෙනුවෙන් සේවය කළ අතර, ඉදිරියටත් ඔබතුමන්ගේ දැක්ම සාර්ථක කර ගැනීමට අප වෙහෙස වී කටයුතු කිරීමට සූදානම්ව සිටිමු.

එලෙස ඔබතුමන් සමග එක්ව එක ගමනක් යැමට සූදානම් මෙම අවස්ථාවේ යම් යම් අවස්ථාවාදීන් දේශපාලන අධිකාරියේ රැකවරණය හා ආශිර්වාදය පවතින බව පවසමින් එම සේවනේ සිටම ආයතනයේ ආරක්ෂාව පතන සේවකයන් සහ ආයතනය විනාශයට ඇද දමමින් තම තමන්ගේ වුවමනා එපාකම් සපුරා ගනිමින් ඇත.

වැඩ කරන සේවකයන් ලෙස ඇතිව ඇති මෙම තත්වය ආයතනය සහ පාලනාධිකාරිය පිළිබඳව දැඩි කලකිරීමෙන් සහ අප්‍රසාදයට පත්ව ඇත. එසේ අප්‍රසාදයට පත්වනුයේ අදාල පුද්ගලයා නොව ආයතනය, රජය සහ විශේෂයෙන් ඔබතුමන්ගේ නාමය වේ. ආයතනයේ පාලනාධිකාරිය මේ සම්බන්ධයෙන් දැනුවත්ව ඇති බව අප සියළුම දෙනා විශ්වාස කරමු. නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ආයතනය ඉහත අයගේ පාලනයට අනුව ගෙන යන බව පැවසිය යුතුවේ. එලෙස ඔබතුමන් පවා අප්‍රසාදයට පත්වූ අවස්ථාවන්ම වැළැක්වීමේ අරමුණිනි ඔබතුමන් වෙත පහත කරුණු ගෙනහැර දැක්වීමට අදහස් කරමු.

මෙහු කලක් පොළොන්නරුව කළාපයේ අධික්ෂණ නිළධාරියෙකු ලෙස කටයුතු කොට දැනට වැඩබලන ප්‍රාදේශිය කළමණාකරුවෙකු ලෙස කටයුතු කරන සේවක අංක 1120 එස්.ජේ. ගලප්පත්ති යන අය වේ. මොහුට ආයතනයේ විමර්ෂණ අංශය මගින් අක්‍රමිකතා හා දූෂණ සම්බන්ධයෙන් විමර්ෂණයක්ද පැවතින අතරම, අධික තොග අඩුමාණ සම්බන්ධයෙන් විමර්ශණයක් පැවතිද්දීම ඒ සම්බන්ධ කිසිදු තැකීමක් නොකොට ආයතනයේ යම් යම් නිළධාරීන්ගේ බලපෑම මත ඉහත තනතුරුද පිරිනම ඇත. නමුත් ආයතනයේ නිළධාරීන් මෙම පත්කිරීම් ඔබතුමන් ඇතුළු දේශපාලන අධිකාරියේ නමට බැර කර ඇත. කෙසේ වෙතත් ඔහුගෙන් ආයතනයට වන තතු මෙලෙස දක්වා සිටීමට කැමැත්තෙමු.

මොහු අධීක්ෂණය කරන කළාපයේ බොහෝ අලෙවිසැල් කළමණාකරුවන් සහ කළමණාකාරවරියන් දැඩි පීඩනයකින් කළකිරීමකින් සහ දැඩි මානසික ආතතියකින් යුතුව කටයුතු කරනු ලබයි. බොහෝ අලෙවිසැල් සේවක සේවිකාවන්ටද එම තත්වය එසේම බලපා ඇත. දේශපාලන අධිකාරිය සහ ආයතනයේ ප්‍රධාන කළමණාකාරීත්ව නිලධාරීන්ගේ බලය හසුරුවන්නෙකු මෙන් ක්‍රියා කිරීම නිසා දුෂ්කරතාවයන්ට පත්වූ සේවකයන්, කළමණාකරුවන් තමන්ගේ රැකියාවේ අවශ්‍යතාවය නිසාම සියල්ල විඳදරා ගනිමින් කටයුතු කරමින් සිටී.

අලෙවිසැල් වල එකතුවන කාඩ්බෝඩ් සහ පොලිසැක් උර අලෙවියෙන් ලබන ආදායමෙන් සෑම අලෙවිසැලක්ම මාසිකව මොහුගේ කොටස වෙන්කර ලබා දිය යුතු අතර එය එක් අලෙවිසැලකින් රු. 5000 /= සිට රු. 10,000 / = අතර අගයක් ගනී. එය අනිවාර්යෙන් ලබා දිය යුතු වන අතර එසේ නොවන්නේනම් සේවකයන් පීඩනයට පත්කොට හෝ ඔහු එම අවස්ථාව ලබා ගනී.

තවද නව අලෙවිසැල් විවෘත කිරීමට එම අලෙවිසැල් වලට ලැබෙන රු 60,000 /= විශේෂ සුළු මුදල් කිසිදු අවස්ථාවක අදාල අලෙවිසැලේ කළමණාකරුට ලබා නොදෙන අතර ඔහු එම මුදල තමන් සතුව තබා ගනී. අලෙවිසැල් විවෘත කිරීමට අදාල සියළුම වියදම් අදාල අලෙවිසැලේ කළමණාකරු සහ සේවකයන් විසින් පෞද්ගලිකව දරා අලෙවිසැල විවෘත කිරීමේ කටයුතු සිදුකළ යුතුය.

තවද නව අලෙවිසැල් විවෘත කිරීමේදී අදාල ගොඩනැගිල්ලේ හිමිකරුගෙන්ද නිළධාරීන්ට සංග්‍රහ කිරීමට යැයි පවසමින් මුදල් ලබාගන්නා අතර, මෑතකදී විවෘත කළ **මින්නේරිය අලෙවිසැලේ** ගොඩනැගිලි හිමිකරුගෙන් රු. 50,000 /= ක අල්ලසක් ලබාගෙන ඇති අතර, මෙම අවස්ථාවේ ඔවුනොවුන් අතර මත ගැටුමක්ද නිර්මාණය වී ඇත.( මින්නේරිය ගොඩනැගිලි හිමිකරුගේ දුරකථන අංකය වනුයේ - 071-4590789 )

මීට අමතරව යම් යම් අවස්ථාවලදී මොහු විසින් භාණ්ඩ ලැයිස්තු අලෙවිසැල් වලට යවන අතර, අලෙවිසැල් වලින් එම භාණ්ඩ සැපයිය යුතු වන නමුත් ඒ වෙනුවෙන් කිසිදු අවස්ථාවක මුදල් ගෙවීමක් ඔහු විසින් සිදු නොකරයි.

අලෙවිසැල් කළමණාකරුවන්ට තර්ජනය කරමින් මොහුගේ තනි තීරණ මත පමණක් කටයුතු කරන මොහු ආයතනයේ නිලධාරින්ගේ නියෝග නීති පවා නොතකමින් කටයුතු කරන අතර, ඔහුගේ තීරන යම් ආයතනික නීති බවට ඔහු විසින්ම පත් කරගෙන සිටී. මෙය මෙම කළාපය තුළ සේවය කරන සියළුම සේවකයන්ට දැඩි පීඩනයක්ව පවතී.

ලංකා සතොස ආයතනයේ මානව සම්පත් අංශයේ නිර්දේශිත හෝ නාමික තනතුරක් නොවන අධික්ෂණ නිළධාරී යැයි තනතුරක් සභාපතිතුමන්ගේ දේශපාලන මැදිහත්වීමෙන් ලබාගෙන ආයතනික තනතුරු වක්‍රලේඛයන් වලටද පටහැනිව ආයතනික වැඩකරන සේවකයන් මෙහෙයවමින් සිටී. තවද ආයතනික ගෙවීම් පටිපාටියෙන් සම්පූර්ණයෙන් බැහැරව ලංකා සතොස අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු අනුමැතියකින් හෝ දැනුවත් වීමකින් තොරව සභාපතිවරයා මගින් දුන් ලිපියකට පමණක් අදාලව විවිධ බිල්පත් ඉදිරිපත් කරමින් මාසිකව රු. 25,000 /= ක දීමනාවක්ද මොහු විසින් අයතා පරිදි ලබා ගනු ලබයි. මෙය ආයතනික ගෙවීම් පටිපාටීන් සම්පූර්ණයෙන් උල්ලංඝණය කිරීමකි.

මෙවැනි පුද්ගලයින් යම් යම් දේශපාලන අධිකාරියේ මැදිහත්වීමක් බව පවසමින්, උදම් අනමින් ආයතනය පරිහානියට කටයුතු සිදු කිරීම මගින් අප්‍රසාදයට පත්වන්නේ ඔහු නම් වශයෙන් පවසන, හැඳුනුම් ඇතැයි සලකන වැදගත් අමාත්‍යය වරුන්, නිළධාරීන්, වෙළද ඇමති තුමන් සහ ඔබතුමන් වේ. එතුළින් මුළු රජයම ආයතනය තුළින් අප්‍රසාදයට පත්වෙමින් ඇත.

අපද ඔබතුමන්ට ගරු කරන ආයතනය රැක ගැනීමේ අරමුණ සහිත සේවකයන් වන නිසා මෙම ගැටළුව තවදුරටත් විශාල ගැටළුවක් වීමට පෙර ඔබතුමන් දැනුවත් කරමි. එසේ ගැටළුව ඔබතුමන්ට ඉදිරිපත් කරනුයේ එක් පුද්ගලයකු ඉලක්ක ගත කොට එම පුද්ගලයාට දොස් පැවරීමට නොව මෙම කළාපය තුළ සේවය කරන සියළුම සේවකයන්ගේ සුරක්ෂිතතාවය, අලෙවිසැල් සුරක්ෂිතතාවය මගින් ආයතනයේ කීර්ති නාමය ආරක්ෂා කර ගැනීමත් ඔබතුමන් ඇතුළු සමස්ථ රජයටම ගොඩනැගී එන අප්‍රසාදය වළක්වා ගැනීමටය.

මුළු මහත් ශ්‍රී ලාංකික දේශයේ සහ ලංකා සතොස ආයතනයේ පෙර සුභ ගමන් පතන ඔබතුමන්ට ශක්තියක් වන අප වැඩකරන සේවකයන්ට ඉහත කරුණ සම්බන්ධයෙන් සාධනීය විසඳුමක් ලබාදීමට ඔබතුමන්ගේ අවධානය යොමුකිරීමට කාරුණිකවන ලෙස ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිමු.

සියළුම සේවකයන් වෙනුවෙන්,

**ලංකා සතොස සේවක එකමුතුව.**

පිටපත් - ගරු වෙළද අමාත්‍යයතුමා - බන්දුල ගුණවර්ධන මැතිතුමා

ගරු රොෂාන් රණසිංහ මැතිතුමා,

අමාත්‍යාංශ ලේකම් තුමිය - වෙළද අමාත්‍යාංශය,

සභාපතිතුමා - ලංකා සතොස.

අධ්‍යක්ෂ මණ්ඩලය - ලංකා සතොස.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පරිපාලන